**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව,**
**හම්බන්තොට දිස්ත්‍රික්කය.**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 07 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී ඉදිකළ රු. 1,948,022 ක් වූ නොදිරන කසළ වෙන් කිරීමේ ගබඩාවේ පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී ජර්නල් අංක 02 මගින් නිවැරදි කරමි. |
| (ii) | එකතු පිරිවැය රු. 1,297,047 ක් වූ පල්ලියවත්ත මහජන පුස්තකාලය සහ පොදු වැසිකිළිය ඉවත් කර තිබුණත් එම වටිනාකම ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | ඉවත් කළ වත්කම්වල පිරිවැය ගිණුම් වලින් ඉවත් කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී ජර්නල් අංක 03 මගින් නිවැරදි කරමි. |
| (iii) | දෙබරවැව පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී ඉවත් කළ එකතු වටිනාකම වූ රු. 1,125,000 ක් වූ ගොඩනැගිලි සහ පොදු වැසිකිළි ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | ඉවත් කළ වත්කම්වල පිරිවැය ගිණුම් වලින් ඉවත් කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී ජර්නල් අංක 04 මගින් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2017 වර්ෂයේදී ඉදිකළ දෙබරවැව පොළ ගොඩනැගිල්ල, පොදු වැසිකිළිය සහ මාළු වෙළඳසැලෙහි එකතු වටිනාකම වූ රු. 5,100,816 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී ජර්නල් අංක 05 මගින් නිවැරදි කරමි |
| (v) | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මත වෙන්දේසි කරන ලද පිරිවැය රු. 130,000 ක් වූ ට්‍රැක්ටර් ටේලරය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | වෙන්දේසි කරන ලද භාණ්ඩවල පිරිවැය ඉවත් කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී ජර්නල් අංක 06 මගින් නිවැරදි කරමි |
| (vi) | ප්‍රාදේශීය සභාවට පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ ට්‍රැක්ටර් ටේලරයේ වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | තොරතුරු ප්‍රාදේශීය සභාවේ නොමැති බැවින් වටිනාකම ගිණුම්ගත නොකරන ලදී |
| (vii) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් සහ පරිත්‍යාග ලෙස ලද වත්කම් 04 ක එකතු වටිනාකම වූ රු. 98,890 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී ජර්නල් අංක 07 මගින් නිවැරදි කරමි |
| (viii) | සමාලෝචිත වර්ෂයේදී උසාවි දඩ ආදායම හා මුද්දර ගාස්තු ආදායම පිළිවෙලින් රු. 979,772 ක් හා රු. 6,091,015 කින් වැඩිපුර ගිණුම් ගතකර තිබුණි. | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරමි |
| (ix) | පෙර වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට අදාල එකතු වටිනාකම රු. 409,031 ක් වූ ගනුදෙනු සමාලෝචිත වර්ෂයේ ණයහිමි ගිණුමට බැර නොකර සමුච්චිත අරමුදල් ගිණුමට බැරකර තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමේදී ඊට අදාළ ලෙජර් ගිණුම් මගින් ගැලපීම සිදු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන පරිදි කටයුතු කරමි |
| (x) | සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ණයහිමි ප්‍රතිපාදන වෙන් කිරීමේදී රු. 630,973 ක් වැඩිපුර ප්‍රතිපාදනය කර තිබුණි. | ණයහිමි වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී ජර්නල් අංක 08 මගින් නිවැරදි කරමි |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 11 කට අදාළ එකතුව රු. 53,521,200 ක් වූ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 7,689,590 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ශේෂයන්හි අසමානතා ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි |

**(ඇ) අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල පැවති රු .303,668 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඒ පිළිබඳව සොයා බලා ගිණුම්වල අවශ්‍ය ගැළපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | 2019 ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 47,793,768 ක් වූ ගිණුම් විෂයයන් 16 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විස්තරාත්මක උපලේඛන සකස් කර ලබා දීමට කටයුතු කරමි |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 ගිණුම් සමඟ ඉදිරිපත් කරමි |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් අදාළ කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවත්, රු. 279,869 ක අත්තිකාරම් සම්බන්ධව එපරිදි කටයුතු කර නොතිබුණි | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වටිනාකම රු. 166,869 ක් වූ අත්තිකාරම් ශේෂය පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි අතර 2018 වර්ෂයට අදාළ වූ රු. 113,000 ක් වූ අත්තිකාරම් ශේෂය පියවන ලදී |
| (ඇ) | 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ප්‍රකාරව 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රය | වලංගු කාලය ඉක්මවා ගොස් තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍ර 31 ක් රු. 126,480 ක ගාස්තු අයකර බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ බලපත්‍ර 31 ක 2019 මැයි 31 දිනට පෙර අලුත් කරවීමට කටයුතු කරමි |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 13 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 13 හි ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමි |
| (ඉ) | දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක 01/2014 දරන චක්‍රලේඛය | ඇප තැබිය යුතු තනතුරු 04 කට අදාළව රු. 39,000 ක ඇප තැන්පත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඇප තැබිය යුතු නිලධාරීන් 14 කට ඇප තබන ලෙස දන්වන ලදී |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු.20,997,078 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,892,629 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු. 27,015,730ක ඍණ අගයක් ගෙන තිබුණි. | යහපත් මූල්‍ය පාලනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පෙර වර්ෂයේ ගැළපීම් හේතුවෙන් සමුච්චිත අරමුදල ඍණ අගයක් විය |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,872,000 | 3,021,970 | 2,815,626 | 3,223,896 | 2,820,000 | 2,963,492 | 3,100,407 | 3,252,567 |
| කුලී | 10,351,300 | 14,715,167 | 12,665,597 | 3,372,682 | 9,622,700 | 10,145,003 | 10,717,314 | 1,089,089 |
| බලපත්‍ර ගාස්තු | 13,150,000 | 16,708,495 | 15,520,979 | 1,291,016 | 13,061,500 | 14,720,225 | 15,087,881 | 336,423 |
| වෙනත් ආදායම් | 30,163,900 | 26,802,429 | 23,456,152 | 22,153,406 | 23,379,400 | 14,509,692 | 12,877,398 | 18,214,481 |
| එකතුව | 56,537,200 | 61,248,062 | 54,458,354 | 30,041,000 | 48,883,600 | 42,338,412 | 41,783,000 | 22,892,560 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 84,140,622 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 54,458,354 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 65 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | උසාවි දඩ, මුද්දර ගාස්තු, පොළ බදු හා විනෝද බදු හිඟය වැඩි වීමෙන් හිඟය වර්ධනය වී තිබුණි |

**2.3.3 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් බදු ආදායම රු. 2,900,144 ක් වූ අතර හිඟය අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් බදු අය කිරීමට දේපල හිමියන්ට රතු නිවේදන භාර දී ඇති අතර, ආදායම් පරීක්ෂකවරියන්ට විනිග්‍රහන බලපත්‍ර ලබා දුන්නෙමි |
| (ආ) | බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ කලින් කලට හඳුනාගෙන වරිපනම් බල ප්‍රදේශය සංශෝධනය කළ යුතු වුවත්, 1986 මාර්තු 14 දිනැති ගැසට් පත්‍රයෙන් හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකර තිබුණි. | වරිපනම් බල ප්‍රදේශ කලින් කලට සංශෝධනය කළ යුතුවේ. | 2018 ජූලි 18 සභා රැස්වීමේ තීරණ අංක 20 මගින් වරිපනම් ප්‍රදේශ සංශෝධනය කර නීතිමය කටයුතු සපුරා ගැනීමෙන් අනතුරුව අදාළ ප්‍රදේශවල ගාස්තු අය කරමි |
| (ඇ) | වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කර වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අයකළ යුතු වුවත්, 2007 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් අයකර තිබුණි | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ නව තක්සේරුවක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කළත්, මෙතෙක් තක්සේරු වාර්තා ලැබී නැත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 554,225 ක කසළ බදු අයකර ගෙන නොතිබුණි | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඡේදය පිළිගන්නා අතර රු. 457,725 ක් 2019 අප්‍රේල් 23 දින අයකර ගත් බවත් ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |

### 2.3.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර වලින් ලැබිය යුතු කඩ කුලී රු. 2,482,498 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | 2019 මාර්තු 31 දිනට හිඟයෙන් රු. 543,608 ක් අයකර ඇති අතර, ඉතිරිය කඩිනමින් අය කරමි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු යන්ත්‍රෝපකරණ කුලී ආදායම් සහ නිවාස කුලී පිළිවෙලින් රු. 336,150 ක් හා රු. 72,072 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | 2019 ජනවාරි 31 දින රු. 24,750 ක මුදලක් අයකළ අතර, ඉතිරිය ගෙවන ලෙස අදාළ පුද්ගලයන්ට දන්වන ලදී |

### 2.3.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර බදු පිළිවෙලින් රු. 79,250 ක් සහ රු. 202,400 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | හිඟ ගාස්තු අයකර ගත යුතුවේ . | 2019 වර්ෂයේ මුල් කාර්තුව තුළදී හිඟයෙන් රු. 30,200 ක් අය කර ඇති අතර, ඉතිරිය අය කිරීමට කටයුතු කරමි |

### 2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 1,738,558 ක් හා රු. 16,269,432 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ මුදලින් රු. 10,000,000 ක් අයකර ගෙන ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | | | |
|---|---|---|---|
| (i) | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා භාවිතා කරන වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අක්කර 10 ක ඉඩම සඳහා වූ විවිධ අවසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර 05 ක් සභාව වෙත පවරා දීමට කටයුතු කර ඇති අතර, තවත් අක්කර 25 ක ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරන ලදී |
| (ii) | භූමියේ කොටසක ඝන අපද්‍රව්‍ය ගිනි තබා තිබූ අතර, කසළ බැහැර කරන භූමියට පැමිණෙන අලින් හා ගවයින් වැනි සතුන් කසළ ආහාරයට ගැනීම නිසා එම සතුන්ගේ ජීවිතවලට අවධානමක්ද පැවතුණි. | කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉඩමේ අයිතිය තහවුරු වී නොමැති නිසා වැටක් ගැසීමට නොහැකි අතර අනවසර පුද්ගලයන් පැමිණ ගිනි තැබීම් සිදු කරනු ලබන අතර, ඉදිරියේදී ඉඩම පවරා ගැනීමෙන් පසු අලි වැටක් ගසා නිවැරදි කරමි |
| (iii) | මධ්‍යම පරිසර අධිකාරියේ අංක SU-B 01316(R1) දරන පරිසර ආරක්ෂණ බලපත්‍රය පරිදි ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ හා පහසුකම් කොම්පෝස්ට් සැකසුම් භූමියේ ස්ථාපිත කර නඩත්තු කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි ඉටු කළ යුතුවේ. | ගිනි නිවීමේ උපකරණ හා පහසුකම් ස්ථාපිත කරමි |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදී තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ අවබෝධයක් ලබා ගෙන ජීවන තත්ත්වය නංවාලීම සඳහා වූ දිගු කාලීන සැලසුම් සකස් කරමි |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් සභා බල ප්‍රදේශයේ ඉදි කරනු ලබන අනවසර ඉදි කිරීම් හඳුනා ගැනීම හා වැලැක්වීම සඳහා සමාලෝචිත හා පෙර වර්ෂයන් වලදීත් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සමීක්ෂණයන් මගින් අනවසර ඉදි කිරීම් හඳුනාගත යුතුවේ. | 2019 වර්ෂයේ සිට මාසිකව තාක්ෂණික නිලධාරී යොදවා අනවසර ඉදි කිරීම් පිළිබඳ සමීක්ෂණ සිදු කරමි |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් 2014,2015 සහ 2016 වර්ෂවල අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් 312 ක කාලය අවසන් වී තිබූ අතර, එම ගොඩනැගිලි සඳහා රු. 1,639,804 ක ගාස්තු අයකර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | අදාළ පිරිවිතරයන්ට අනුව ඉදිකර ඇත්ද යන්න පරීක්ෂා කර ගාස්තු අයකර අනුකූලතා සහතිකය නිකුත් කළ යුතුවේ. | තාක්ෂණික සේවා නිලධාරීන් යොදවා පසුවිපරම් කිරීමට කටයුතු කරමි |
| (ඇ) | කර්මාන්ත සඳහා සාධ්‍යතා වාර්තාවක් සකස් කර නොතිබුණි. | සාධ්‍යතා වාර්තාවක් සකස් කළ යුතුවේ. | 2019 වර්ෂයේ කර්මාන්ත සඳහා සාධ්‍යතා වාර්තාවක් සකස් කරමි |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 21 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 12 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් කටයුතු කරමි |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු කර්මාන්ත පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පරිසර බලපත්‍ර නිකුත් කළ යුතු කර්මාන්ත හඳුනාගත යුතුවේ. | සමීක්ෂණයක් සිදුකරන ලෙස විෂය නිලධාරීන් දැනුවත් කළ අතර, ඉදිරියේදී සමීක්ෂණය සිදු කර වාර්තාව ඉදිරිපත් කරමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 05 පරිච්ඡේදය ප්‍රකාරව සභාව විසින් බදු දී තිබුණු කඩ කාමර ගිවිසුම් වර්ෂ 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර 132 ක ගිවිසුම් යාවත්කාලීන කර ඇති අතර ඉතිරි කඩ කාමර 336 හි ගිවිසුම් 2019 ජුනි 30 දිනට පෙර යාවත්කාලීන කරමි |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ ස්ථාපිත දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වෙනුවෙන් වාර්ෂික බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | වාර්ෂික බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර අදාළ ගාස්තු අය කරන බවත්, ඩයලොග් ආයතනයට ලිඛිතව දන්වන ලදී |
| (ඈ) | සභාව අයත් නිල නිවාස සඳහා කුලී අය කිරීමේදී ආයතන සංග්‍රහය පදනම් කර නොගෙන මාසිකව රු. 75 ක කුලියක් අයකර තිබුණි. | මාසිකව තක්සේරු කුලියක් අයකළ යුතුවේ. | මාසික කුලිය රු. 75 ක් ලෙස අය කිරීමේ පදනම සොයාගත නොහැකි වන අතර සංවර්ධන කටයුත්තක් සඳහා නිල නිවාස කඩා ඉවත් කරන බැවින් තක්සේරු නොකරන ලදී |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු පිරිවැය රු. 5,807,500 ක් වූ බැකෝලෝඩර් යන්ත්‍රය වර්ෂ 07 ක් පමණ පෞද්ගලික ගරාජයක ස්වභාවික ආපදාවන්ට ලක්වෙමින් දිරාපත් වෙමින් පැවතුණි. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුවේ. | විධිමත් පරිදි සහා අනුමැතියක් ලබා ගෙන කැට් ආයතනයෙන් අවශ්‍යය උපාංග මිලදී ගෙන දැනට භාරදී ඇති ගරාජය මගින් අලුත්වැඩියාව සිදු කරමි |
| (ආ) | ප්‍රාදේශීය සභාව සතු ධාවන තත්ත්වයේ පවතින වාහන හා යන්ත්‍රෝපකරණ 18 ක් නවතා තැබීමට වාහන අංගනයක් සකස් කර නොතිබීමෙන් වාහන හා යන්ත්‍රෝපකරණ ස්වභාවික ආපදාවන්ට ලක් වෙමින් පැවතුණි. | වාහන අංගනයක් සකස් කළ යුතුවේ. | 2020 අයවැය මගින් මුදල් වෙන්කර වාහන අංගනය ඉදි කරන අතර දැනට මහසෙන්පුර ආදාහනාගාරය අසළ වාහන ගාල් කර ඇත |

#### 3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු වාහන 06 ක් දීර්ඝ කාලයක සිට අක්‍රීයව පවතින අතර, ඒවා අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අක්‍රීයව පවතින වාහන අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුවේ. | කඩිනමින් අලුත්වැඩියාව සිදු කරමි |

### 3.5.3 පවරා නොගත් වත්කම්

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් බුක්ති විඳින ඉඩම් 165 ක හා වාහන 09 ක ලියාපදිංචි අයිතිය පවරා ගෙන නොතිබුණි. | වත්කම්වල අයිතිය සභාව වෙත පවරාගත යුතුවේ. | ඉඩම් 162 ක ලැයිස්තුව ප්‍රධාන අමාත්‍යාංශ වෙත යොමු කර ඇති අතර ඉදිරියේදී පවරා ගැනීමේ කටයුතු සිදු කරමි |

### 3.5.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය සභාව සතු විවිධ ස්ථානවල තිබූ බෝට්ටු දෙකක් මහන මැෂින් 11 ක් ජෙනරේටරයක්, කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රයක්, ගල් ක්‍රෂර් යන්ත්‍රය සහ 50kg ධාරිතාවේ බොල්විල් යන්ත්‍ර 02 ක් දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි | නිෂ්කාර්ය වත්කම් අපහරණයට හෝ අලුත්වැඩියා කිරීමට හෝ කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශයන් 2019 අප්‍රේල් 23 දිනැති සභා තීරණ 07 යටතේ පිළිගෙන ඇති නිසා එම නිර්දේශ ක්‍රියාත්මක කරමි |
| (ආ) | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භූමියේ රු. 1,948,022 ක වියදමින් 2017 දෙසැම්බර් 23 දින වැඩ අවසන් කර තිබූ ද්‍රව්‍ය රැස් කිරීමේ ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේදීත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි | අදාළ ගොඩනැගිලි ප්‍රයෝජනයට ගත යුතුවේ. | වානිජ වටිනාකම් සහිත ද්‍රව්‍ය ගබඩා කිරීමට භාවිතා කරමි |

### 3.5.5 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් ලබා දී තිබුණු නිර්දේශ 2019 මාර්තු 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුවේ. | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කරමි |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරමි |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 12,510,925 ක් වූ අතර එය සියයට 21 සිට සියයට 25 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී විශ්ලේෂනාත්මකව අයවැය සකස් කරමි. |
| (ආ) | වියදම් විෂයයක අයවැයගත සීමාව ඉක්මවා රු. 3,745,404 ක හෙවත් සියයට 34 ක වියදම් දරා තිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී විශ්ලේෂනාත්මකව අයවැය සකස් කරමි. |
| (ඇ) | වියදම් විෂයයන් 06 ක එකතුව රු. 22,669,898 ක ඉතිරිවීම් පැවති අතර එය සියයට 22 සිට සියයට 62 ක පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී විශ්ලේෂනාත්මකව අයවැය සකස් කරමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී අදාළ පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි |